# මිනිස් පවුලේ කතන්දරය

අපේ මහ පොළොවෙන් මතු පිට ප්‍රමාණය වර්ග සැතපුම් ලක්ෂ 2,000 කට ආසන්නයි. ඒත් මෙයින් 70% ක් ම මුහුද. ඉතිරිය ගොඩ බිම වුනත් එයින් සෑහෙන තරමක් කාන්තාර හා හිම කලාප. අවුරුදු ලක්ෂ 2 1/2 කට පමණ කලින් මිනිසා මේ අතරට පා තැබුවා.

## අවුරුදු දෙදහකට පෙර

මිසරයේ පිරමීඩ අවුරුදු තුන් දහක් පමණ නොසැලී තිබුණා. චීනයේ ලෝක මහා ප්‍රාකාරයට අවුරුදු 200 ක් වෙලා. අවුරුදු පන්සියයකට කලින් බුදුන් වහන්සේ ගේ උපත. ජූලියස් සීසර් වියෝවුනා විතරයි. ක්‍රිස්තුස් වහන්සේ ගේ උපත අත ළඟ. පොලෝ තලයේ මිනිස් පරපුර ලක්ෂ 2,500යි. ඉඩකඩම් ඕනෑ පදමට. ඒත් වගා කෙරුනේ හරි ටිකයි.

## අවුරුදු දහකට පසු

මිනිස් පවුල, ලක්ෂ 3,500 යි. මිනිසුන් තවමත් දඩයම් කරුවන්, ගොපල්ලන්, ධීවර යන් හා ගොවියන් පමණයි. යුරෝපයේ මහ දෙව්මැදුරු ගොඩ නංවනවා. වයිකිංවරු බටහිර බලා සයුරු තරණය කළා.

## තවත් අවුරුදු පන්සියයකින්

මිනිස් පවුල ලක්ෂ 4,500 යි. මිනිසාගේ ගවේෂණ ඇරඹේ. වස්කෝද ගාමා අප්‍රිකාව වටා යයි. කොලම්බස් නව ලොවක් සොයා ගනී. විශ්වයේ කේන්ද්‍රය ලෝකය නොවන බව කොපර්නිකස් පවසයි. මහාමාරියාවට යුරෝපයේ තුනෙන් එකක් ගොදුරු වේ.

## ක්‍රි. ව. 1800 දී

වාෂ්ප හා දුම්වලා තුළින් නව ලෝකය උදවෙයි. කාර්මික විප්ලවය. කම්හල් නිපැයුම්. දුම්රිය දහ අතට. මුල් ම වෘත්තීය සමිති. වසංගත වලට බෙහෙත්, මිනිස් පවුල ලක්ෂ 10,000 යි. ජනගහණය පිළිබඳ මැල්තස් ගේ සුප්‍රකට අදහස්.

## අපේ සිය වස උදවෙයි

මුල් ම මෝටර් රථ ගමන් අරඹයි. ගුවන් යානයක් තත්පර දොළහක මංගල ගමනක. නව කාර්මික දැනුම පතල වේ. මිනිසා ගේ ජීවිත කාලය දික්වෙයි. බඩගින්න හා වසංගත බලපෑම් මැද්දේ ද මිනිස් පවුල ලක්ෂ 16,500 යි.

## අද අපි

අද අපේ ප්‍රමාණය දෙගුණයක්. අධිරාජ්‍ය බිඳ වැටිලා. බඩගින්න හා හාමතට එරෙහිව සටන් වදින නිදහස් ජාතීන් ලොව පුරා. තම දරුවන්ට යහපත් දිවි පෙවතක් පතන මිනිස් පවුලේ ප්‍රමාණය ලක්ෂ 40,000 ක් තරම්. මිනිස් පවුලේ බර පොලෝ සම්පතට දැනෙන්න පටන් අරන්.

## ලොවින් අඩක් හාමතේ

මිනිස් පවුලෙන් ලක්ෂ 20,000 ක් මන්ද පෝෂණයෙන් පෙළෙන බව ආහාර හා කෘෂිකර්ම සංවිධානය ගණන් බලා තියෙනවා. තම ආහාර වලින් දිනකට කැලරි 1,900 ක් ලබා ගත නොහැකි අය මේ කොටසට ඇතුළත්.

මේ අතර තවත් ලක්ෂ 4,620 ක් හාමතින් පෙළෙන බවත් හෙළි වෙලා. මින් අඩක් ම අවුරුදු පහට අඩු ළමුන්. ලක්ෂ 280 ක් දියුණු රටවලත්, ලක්ෂ 670 ක් අප්‍රිකාවේත්, ලක්ෂ 3010 අග්නිදිග ආසියා රටවලත්. 1985 වන විට හාමතින් පෙළෙනවුන්ගේ ප්‍රමාණය ලක්ෂ 7,500 ක් වෙතැයි අපේක්ෂා කෙරේ.

## ක්‍රි. ව. 2000 දී

මිනිස් පවුල මේ සියවස මුල දී වගේ සිවු ගුණයක් වෙතැයි හිතනවා. ලක්ෂ 65,000 ක්. මේ තරම් කලක් විශාල මිනිස් පවුල රැක බලා ගත්ත පොලෝ සම්පතට මේ බරත් දැරිය හැකි ද? ඒත් වත්මන් ජනගහණය මෙන් දශ ගුණයක් ජීවත් කරවීමට තරම් සම්පත් ලෝකය සතුව ඇති බව ආහාර හා කෘෂිකර්ම සංවිධානය පවසනවා.